# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/53 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2022.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාලසීමාවක් ප්‍රාදේශීය සභා රැස්වීම්වලට සහභාගී නොවීම හේතුකොට ගෙන තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ අංක 08 භාරතීනගර් කොට්ඨාසයට තේරී පත් වූ කනපතිපිල්ලෙයි නිරූබන් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ අංක 08 භාරතීනගර් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුබ්‍රමනියම් රත්නසිංගම් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ජේසුදාසන් ජෙනිටන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සුබ්‍රමනියම් රත්නසිංගම්, තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ අංක 08 භාරතීනගර් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ජේ. ජෙනිටන්,**
තේරීම්භාර නිලධාරි,
තුනුක්කායි ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මුලතිව්.

EOG 08 - 0116

1A - G 37234 — 26 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 12 - කත්තොට කොට්ඨාසයට තේරී පත් වූ පනාපිටි කංකානමලාගේ දිනසිරි කුමාර අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 12 - කත්තොට කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අතාවුද අච්චිල්ලාගේ සරෝජනී ප්‍රියංගිකා ජයසිරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් අතාවුද අච්චිල්ලාගේ සරෝජනී ප්‍රියංගිකා ජයසිරි, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 12 - කත්තොට කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ජේ. එස්. මාධව**
තේරීම්භාර නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 08 - 0117

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.